# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1908/43 - 2015 අප්‍රේල් මස 02 වැනි බ්‍රහස්පතින්දා - 2015.04.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල
පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත
(262 වන අධිකාරය වූ)
පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වගන්තිය යටතේ
එරාවූර් නගර සභාවේ
උප සභාපති ධූරයේ පුරප්පාඩුව පිරවීම

උප සභාපති සභාපති ධූරයට පත්වීම හේතු කොට ගෙන එරාවූර් නගර සභාවේ උප සභාපති ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 65අ(1) වන වගන්තිය යටතේ තනතුර දැරූ උප සභාපති වන මොහමඩ් ඉස්මායිල් මොහමඩ් තස්ලීම් අයත් වන්නා වූ එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත උප සභාපති වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු යයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ ද, ඒ පක්ෂයට අයත් වන්නා වූ ද, ඒ එරාවූර් නගර සභාවේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා මීරා ලෙබ්බෙ රෙබුපාසම් මහතා නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

එරාවූර් නගර සභාවේ තේරීම් භාර නිලධාරී අබ්දුල් මජීදු මහම්මදු කබීර් වන මම, 2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, මීරා ලෙබ්බෙ රෙබුපාසම් මහතා එරාවූර් නගර සභාවේ උප සභාපති වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

ඒ. එම්. එම්. කබීර්,
තේරීම් භාර නිලධාරී,
එරාවූර් නගර සභාව.

2015 අප්‍රේල් මස 01 වන දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
මඩකලපුව.

04 - 653